සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2017 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2017

| | | |
|---|---|---|
| නාට්‍ය හා රංග කලාව - සිංහල I<br>நாடகமும் அரங்கியலும் - சிங்களம் I<br>Drama and Theatre - Sinhala I | 57 S I | පැය තුනයි<br>மூன்று மணித்தியாலம்<br>Three hours |

10386

විභාග අංකය : ………………………………

| | |
|---|---|
| I කොටස | |
| මුළු ලකුණු | 40 |

**උපදෙස්:**

* I කොටස – **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයා, II කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.
* II කොටස – **A** හා **B** කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

● නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**1.** "ප්‍රාසංගික කලාවක් සජීවී විය යුතු ය." යන නිර්ණායකය තහවුරු වීමට වඩාත් උචිත ප්‍රකාශය තෝරන්න.
(1) පටිගත කළ සංගීතය භාවිත නොකළ යුතු ය.
(2) වේදිකාවක් මත පමණක් ම රඟ දැක්විය යුතු ය.
(3) රඟ දක්වන්නවුන් පමණක් සජීවී වීම ප්‍රමාණවත් ය.
(4) රඟ දක්වන්නවුන් මෙන් ම ප්‍රේක්ෂකයන් ද සජීවී විය යුතු ය.
(5) ප්‍රේක්ෂකයා, ක්ෂණික ව ප්‍රතිචාර දැක්වීම අවශ්‍ය ය. (………)

**2.** මාරියස් පෙටිපා හා ලෙව් ඉවනොව් විසින් නර්තන රචනය කරන ලද 'නට් ක්‍රැකර් (Nut Cracker) කෘතිය' අයත් වන්නේ කුමන ප්‍රාසංගික කලාවකට ද?
(1) ගීත නාටක (2) ඔපෙරා (3) නාට්‍ය (4) මුද්‍රා නාට්‍ය (5) බැලේ (………)

**3.** 'ඔපෙරාව' සම්බන්ධ පහත සඳහන් ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) 'හංසවිල' ඔපෙරාවකි.
(2) ඔපෙරාවෙහි, සංගීතයට ප්‍රමුඛත්වය නො ලැබේ.
(3) ඉතාලියේ මෙන් ම චීනයේ ද ජනප්‍රිය කලාවකි.
(4) කිසිවිටෙක කථා වස්තුවක් අන්තර්ගත නො වේ.
(5) වර්තමානය වන විට භාවිතයෙන් ඉවත් ව ඇත. (………)

**4.** 'කරදිය' හා 'නල දමයන්ති' මුද්‍රා නාට්‍ය දෙකෙහි නිර්මාතෘවරුන්ගේ නාම නිවැරදි ව අනුපිළිවෙළින් සඳහන් පිළිතුර තෝරන්න.
(1) එස්. පණීභාරත සහ චිත්‍රසේන
(2) වජිරා සහ චිත්‍රසේන
(3) වජිරා සහ ප්‍රේමසිරි ඛේමදාස
(4) චිත්‍රසේන සහ ඛේමදාස
(5) ප්‍රේමකුමාර එපිටවෙල සහ චිත්‍රසේන (………)

**5.** 'ගීත නාටක' සම්බන්ධ පහත සඳහන් ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ගායනයට විනා රංගනයට ප්‍රමුඛත්වය හිමි නොවන කලාවකි.
(2) පෙරදිග ගීත නාටකය කිසිවිටක බටහිර ඔපෙරාවේ ආභාසය ලබා නැත.
(3) කථා වස්තුවක් පදනම් ව ගොඩනැගෙන්නේ නැත.
(4) 'මනෝහාරී' ප්‍රේමසිරි ඛේමදාසගේ ගීත නාටකයකි.
(5) 'දෙපානෝ' ඩබ්.බී. මකුලොළුවගේ පර්යේෂණාත්මක ගීත නාටකයකි. (………)

**6.** නාට්‍ය පෙළක් සම්බන්ධ පහත සඳහන් ප්‍රකාශ අතුරින් **අනුචිත** ප්‍රකාශය තෝරන්න.
(1) සංවාද හා රංගවිධාන අන්තර්ගත විය යුතු ය.
(2) කථා වස්තුවක් තිබීම අනිවාර්ය නො වේ.
(3) කියවීමෙන් පමණක් වුව ද ආස්වාදය ලැබිය හැකි ය.
(4) වාච්‍යාර්ථය ඉක්මවා ගිය ව්‍යංග්‍යාර්ථවත් භාෂාවක් යෙදීම අනුචිත ය.
(5) නාට්‍යයක් නිර්මාණය කළ හැකි විභව ශක්තියක් තිබිය යුතු ය. (………)

[ දෙවැනි පිටුව බලන්න.

7. ආහාර්යාභිනයට අයත් අංග පමණක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) රූපණය, නාට්‍යපෙළ, පුස්ත, රංගාලෝකය (2) සංගීතය, රංග විධාන, අංග රචනා, සජ්ජීව
(3) රංගාලෝකය, ආභරණ, රූපණය, අංග රචනා (4) අංග රචනා, අලංකාර, සංවාද, පුස්ත
(5) පුස්ත, අලංකාර, අංග රචනා, සජ්ජීව (.........)

8. සාත්ත්වික භාව 04ක් නිවැරදි ව අන්තර්ගත වරණය තෝරන්න.
(1) ස්තම්භ, රෝමාඤ්ච, වේපථු, ස්වරභංග (2) ස්මෘතිය, අශ්‍රු, ප්‍රලය, රෝමාඤ්ච
(3) ස්තම්භ, අශ්‍රු, වේපථු, ග්ලානි (4) රෝමාඤ්ච, ස්වරභංග, නිද්‍රා, ශංකා
(5) ග්ලානි, වේපථු, අශ්‍රු, වෛවර්ණ්‍ය (.........)

9. ට්‍රැජඩි හෙවත් ශෝකාත්ම නාට්‍යයක මූලිකාංග හය ඇරිස්ටෝටල් පෙළගස්වා ඇත්තේ වැදගත්කමේ අනුපිළිවෙළ අනුව ය. නිවැරදි පෙළගැස්ම තෝරන්න.
(1) වස්තුව, චින්තනය, චරිත, ප්‍රේක්ෂාව, සංගීතය, වාග් විලාසය
(2) වස්තුව, චරිත, චින්තනය, වාග් විලාසය, ප්‍රේක්ෂාව, සංගීතය
(3) චරිත, වස්තුව, චින්තනය, ප්‍රේක්ෂාව, වාග් විලාසය, සංගීතය
(4) වස්තුව, චරිත, වාග් විලාසය, චින්තනය, ප්‍රේක්ෂාව, සංගීතය
(5) චරිත, වස්තුව, චින්තනය, සංගීතය, ප්‍රේක්ෂාව, වාග් විලාසය (.........)

10. සංස්කෘත නාට්‍යයක අවස්ථා පඤ්චකය සඳහන් ගොනුව තෝරන්න.
(1) බීජ, බින්දු, පතාකා, ප්‍රකරී, කාර්ය
(2) නර්ම, නර්මස්ඵූර්ජ, නර්මස්ඵෝට, නර්මගර්භ, විමර්ශ
(3) ආරම්භ, ප්‍රයත්න, ප්‍රාප්ත්‍යාශා, නියතඵලප්‍රාප්ති, ඵලාගම
(4) මුඛ, ප්‍රතිමුඛ, ගර්භ, අවමර්ශ, උපසංහෘත
(5) ව්‍යවසාය, විරෝධන, ප්‍රරෝචනා, විචලන, ආදාන (.........)

11. නළුවා හෝ නිළිය රූපණයෙහි යෙදිය යුත්තේ බුද්ධිමය ප්‍රතික්‍රියාවක් දක්වන්නකු ලෙස විනා ආවේශයෙන් නොවන බව ප්‍රකාශ කළ න්‍යායාචාර්යවරයා හා ඔහුගේ රංග රීතිය අන්තර්ගත පිළිතුර තෝරන්න.
(1) කොන්ස්ටාන්ටින් ස්ටැනිස්ලාවුස්කිගේ තද්විධි ක්‍රමය
(2) බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්ගේ ආඛ්‍යාන රංග රීතිය
(3) භරතමුනිගේ නාට්‍යශාස්ත්‍රයේ සඳහන් බාහ්‍ය රංගනය
(4) ඉසුම් අෂිසවාගේ මානසික එළඹුම
(5) මෙයර්හෝල්ඩ්ගේ ජෛව යාන්ත්‍රණය (.........)

12. ඔර්කීස්ට්‍රාව, ප්‍රේක්ෂාලය සහ වේදිකාගෘහය යන අංගත්‍රය සහිතව නිර්මාණය වූ රංග භූමිය අන්තර්ගත රට / රටවල් වන්නේ,
(1) රෝමය හා ග්‍රීසියයි. (2) එංගලන්තය හා ප්‍රංශයයි. (3) ග්‍රීසියයි.
(4) ප්‍රංශයයි. (5) රෝමයයි. (.........)

13. ප්‍රොසීනියම් වේදිකාවක පසුතල දර්ශන මැවීමට, රංගාලෝකය මගින් විශේෂ වෙනස්කම් කිරීමට, කාලය ඇඟවීමට උපකාරී වනුයේ පහත දැක්වෙන වේදිකා තිර අතුරින් කුමක් ද?
(1) හරස් තිරය (2) ගගනිකාව හෙවත් අහස් තිරය (3) ප්‍රධාන තිරය
(4) පැති තිර (5) පසුපස තිර (.........)

● පහත සඳහන් වගුවෙහි ඇති ගීත දෙකක් බැගින් එක් නාට්‍යයකට අයත් වේ. ඒ ආශ්‍රයෙන් අංක **14** සිට **18** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | |
|---|---|
| A - සෝභාව දේ මෙපුර | F - ආලෙ බැන්ද මාගේ රම්‍ය වන් |
| B - දුලා නෙතුපුලා | G - දැක්කොත් පද්මාවතී |
| C - රතදර සිරියා පරදන | H - ප්‍රේමයෙන් මන රංජිත වේ |
| D - සෝබමාන දේව පුරා | I - ගල්ලෙන බිඳලා |
| E - වගුරට නරනිඳු | J - මඬේ ලගින තාරාවුන් |

14. පද්මාවතී නූර්තියේ ගීත වන්නේ,
(1) A සහ J ය. (2) B සහ H ය. (3) C සහ G ය. (4) D සහ G ය. (5) D සහ F ය. (.........)

15. කාලගෝල නාඩගමේ ගීත වන්නේ,
(1) A සහ F ය. (2) B සහ D ය. (3) C සහ F ය. (4) C සහ G ය. (5) D සහ G ය. (.........)

16. මනමේ නාට්‍යයේ ගීත වන්නේ,
(1) B සහ H ය. (2) C සහ F ය. (3) D සහ I ය. (4) E සහ I ය. (5) E සහ H ය. (.........)

17. සිංහබාහු නාට්‍යයේ ගීත වන්නේ,
(1) A සහ I ය. (2) E සහ I ය. (3) F සහ G ය. (4) G සහ I ය. (5) H සහ I ය. (.........)

[ තුන්වැනි පිටුව බලන්න.

18. තාරාවෝ ඉගිලෙති නාට්‍යයේ ගීත වන්නේ,
(1) A සහ D ය. (2) B සහ I ය. (3) D සහ I ය. (4) F සහ I ය. (5) A සහ J ය. (.........)

19. පහත සඳහන් විදුලි පහන් අතුරින් වේදිකාව මත නළුවා පසුපස ගමන් කරවීමට භාවිත කරන්නේ කුමන පහන් වර්ගය ද?
(1) ස්ට්‍රෝබ් පහන (2) ෆොලෝස්පොට් පහන (3) ස්පොට් පහන
(4) බැටින් පහන (5) වර්ණ චක්‍රය (.........)

20. තත්ත්වානුරූපී නාට්‍යයක රංගාලෝකයෙන් උපරිම ප්‍රයෝජනයක් ගැනීම සඳහා අනුගමනය කළ යුතු කරුණු පහත දැක්වේ. ඊට යෝග්‍ය **නොවන** පිළිතුර තෝරන්න.
(1) වේදිකාවේ ගැඹුර රසිකයාට දැනෙන්නට සැලැස්වීම
(2) අවස්ථා තීව්‍ර කිරීම සඳහා උදව් කරගැනීම
(3) පසුතල හා ඇඳුම් සඳහා දීප්තිමත් වර්ණ යොදා ආලෝකය පරාවර්තනය කරවීම
(4) තත්ත්වානුරූපී මායාව ඇති කරගැනීමට උපයෝගී කරවීම
(5) නාට්‍ය ජවනිකා හා අංක වශයෙන් බෙදා ගැනීමට උදව් කරගැනීම (.........)

21. ජපානයේ නෝ නාට්‍ය සම්බන්ධ පහත සඳහන් ප්‍රකාශ අතුරින් **වැරදි** ප්‍රකාශය තෝරන්න.
(1) නෝ වේදිකාව වහලක් සහිත ය.
(2) සෙඅමි මොතොකියෝගේ පුම්කදෙන් නෝ සිද්ධාන්ත අන්තර්ගත කෘතියයි.
(3) නෝ නාට්‍යයක් ජෝ, හා, ක්‍යු යන කොටස් තුනකින් සමන්විත ය.
(4) නෝ නාට්‍යයේ ප්‍රධාන නළුවා හා දෙවන නළුවා ෂිතෙ සහ ෂිතෙ ත්සුරෙ වශයෙන් හැඳින්වේ.
(5) වෙස්මුහුණු භාවිත කෙරේ. (.........)

22. ජපානයේ කබුකි නාට්‍යයට සම්බන්ධ පහත සඳහන් පාරිභාෂික පද අතුරින් අංග රචනා සම්බන්ධ පදය තෝරන්න.
(1) සෙරිදෙෂි (2) නෙම්බුත්සුඔදොරි (3) ජිදයිමොනො
(4) කුමදොරි (5) තියොමොනො (.........)

● පහත සඳහන් පාරිභාෂික පද උපයෝගී කරගෙන අංක **23** සිට **29** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | |
|---|---|---|
| A - පරිකල්පන ශක්තිය | H - එළිඩේර නාටක | O - ප්‍රඛ්‍යාත වස්තුව |
| B - ලාලිත්‍යයෙන් යුත් අංග වින්‍යාස | I - ඩිතිරම්බ් ගායනා | P - යථාර්ථවාදය |
| C - ප්‍රස්තාවනාව (ප්‍රවේශ ප්‍රකාශය) | J - රූපක | Q - එපිඩෝරස් |
| D - ක්වන්නම් කියොත්සුගා | K - මානසික ඒකාග්‍රතාව | R - ආත්මභාෂණ |
| E - සබකෝලයෙන් තොරවීම | L - හෂිගකරි | S - සකලජන |
| F - ආමුඛය | M - සංදර්ශන රථ | T - ඔන්නගත |
| G - කක්ෂ්‍යා විභාගය | N - ස්වාභාවික වාදය | U - රොමැන්ටික්වාදය |

23. රූපණය හා සම්බන්ධ වන්නේ
(1) A, K හා R ය. (2) A, E හා K ය. (3) B, H හා N ය. (4) E, H හා N ය. (5) K, N හා R ය. (.........)

24. නාට්‍ය රීති වශයෙන් සැලැකෙන්නේ,
(1) B, J හා U ය. (2) J, N හා P ය. (3) N, P හා U ය. (4) N, O හා P ය. (5) B, G හා U ය. (.........)

25. මධ්‍යකාලීන නාට්‍ය හා සම්බන්ධ වන්නේ,
(1) H, M හා S ය. (2) C, G හා H ය. (3) H, L හා T ය. (4) D, L හා S ය. (5) H, Q හා S ය. (.........)

26. සංස්කෘත නාට්‍ය හා සම්බන්ධ වන්නේ,
(1) C, F හා J ය. (2) B, J හා K ය. (3) F, J හා U ය. (4) J, O හා P ය. (5) F, J හා O ය. (.........)

27. ජපන් නාට්‍ය හා සම්බන්ධ වන්නේ,
(1) D, M හා R ය. (2) F, H හා T ය. (3) L, Q හා T ය. (4) D, L හා T ය. (5) M, R හා T ය. (.........)

28. ග්‍රීක නාට්‍ය හා සම්බන්ධ වන්නේ,
(1) J, K හා M ය. (2) L, Q හා T ය. (3) C, I හා Q ය. (4) A, G හා J ය. (5) C, Q හා R ය. (.........)

29. නාට්‍යධර්මී රීතිය හා සම්බන්ධ වන්නේ,
(1) G, J හා R ය. (2) B, G හා R ය. (3) C, F හා J ය. (4) E, G හා R ය. (5) G, J හා U ය. (.........)

30. අභිඥානශාකුන්තලයේ සත්වැනි අංකයෙන් කුළුගැන්වෙනුයේ කුමන රසයක් ද?
(1) ශෘංගාර රසය (2) අද්භූත රසය (3) බීභත්ස රසය (4) භයානක රසය (5) වීර රසය (.........)

31. නාට්‍ය අධ්‍යක්ෂවරයා පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරින් **නුසුදුසු** ප්‍රකාශය තෝරන්න.
(1) නාට්‍ය පිටපතක් තම අභිමතය පරිදි අර්ථකථනය කිරීමට අධ්‍යක්ෂවරයාට ඉඩක් නැත.
(2) සූත්‍රධාර සංස්කෘත නාට්‍යයේ අධ්‍යක්ෂවරයා ලෙස සැලකිණි.
(3) නාට්‍ය නිෂ්පාදනය සම්බන්ධ මූලික වගකීම දරන්නා ය.
(4) අධ්‍යක්ෂ, නිෂ්පාදක හා පෙළ රචකයා එක් පුද්ගලයකු විය හැකි ය.
(5) නිෂ්පාදන ක්‍රියාවලියේ දී විවිධ ශිල්පීන් සමග සහයෝගයෙන් ක්‍රියා කළ යුතු ය. (.........)

[ හතරවැනි පිටුව බලන්න.


**32.** පහත සඳහන් ප්‍රකාශ අතුරින් ග්‍රීක හා එළිසබෙතීන නාට්‍ය වර්ග දෙකට පොදු **නොවන** ප්‍රකාශය තෝරන්න.
(1) නාට්‍ය දෙවර්ගය ම දහවල් කාලයේ රඟ දැක්විණි.
(2) වෘත්තානුකූල බස් වහරක් භාවිත වේ.
(3) ස්ත්‍රීහු රංගනයට සහභාගි නො වෙති.
(4) එළිමහන් රංගභූමියක් භාවිත වේ.
(5) ඛේදනීය වීරයෙක් සිටී. (………)

**33.** ග්‍රීක හා සංස්කෘත යන නාට්‍ය සම්ප්‍රදාය දෙකට පොදු **නොවන** ප්‍රකාශය තෝරන්න.
(1) සම්ප්‍රදාය ද්වයෙහි ම ප්‍රඛ්‍යාත වස්තු භාවිත කෙරේ.
(2) වස්තුවෙහි මුඛ්‍ය අභිප්‍රාය රස නිෂ්පත්තිය වේ.
(3) සම්ප්‍රදාය ද්වයෙහි ම ආත්මභාෂණ භාවිත වේ.
(4) නේතෘ හෙවත් නායක චරිතයක් ඇත.
(5) නාට්‍යධර්මී සම්ප්‍රදායට බර ය. (………)

**34.** පහත සඳහන් ප්‍රකාශ අතුරින් ක්ෂණික නිරූපණයක් සාර්ථක වීමට අදාළ **නොවන** ප්‍රකාශය තෝරන්න.
(1) විනාඩි 10ක් වැනි කාලයක් ඇතුළත ගොඩනගාගත යුතු වීම
(2) ලැබී ඇති කාලය හා අවකාශය උචිත ලෙස භාවිත කිරීම
(3) ක්ෂණික ව මාතෘකාවක් තෝරාගැනීම
(4) ක්ෂණික නිරූපණ හා අනුකරණය පිළිබඳ පරිචයකින් යුතු වීම
(5) කලින් සකසාගත් පිටපතක් මත රංගනය ගොඩනගා ගැනීම (………)

**35.** 'රංගභූමි පාලක' සම්බන්ධ පහත සඳහන් ප්‍රකාශ අතුරින් **නොගැළපෙන** පිළිතුර තෝරන්න.
(1) මොහු ඇතැම් විට වේදිකා පාලක හෝ රංගභූමි කළමනාකරු ලෙස හැඳින්වේ.
(2) නාට්‍යයේ සෑම පුහුණුවීම් වාරයකට ම සහභාගි වීම අවශ්‍ය වේ.
(3) නාට්‍ය රඟ දැක්වීමට සම්බන්ධ සියලු පාර්ශ්ව කළමනාකරණය කළ යුතු ය.
(4) ඉතා සාර්ථක නාට්‍යයක් වුව ද අකාර්යක්ෂම රංගභූමි පාලනයකින් අසාර්ථක විය හැකි ය.
(5) මොහුගේ සේවය අවශ්‍ය වන්නේ නාට්‍යය වේදිකාගත කිරීමේ දී ය. (………)

**36.** ඡායාරූපයේ දැක්වෙන පහන් වර්ගය ඇතුළත් පිළිතුර තෝරන්න.



(1) ධාරා පහන
(2) තිත් පහන
(3) අල්ට්‍රා වයලට් පහන
(4) බැටින් හෙවත් ස්ට්‍රිප් පහන
(5) භ්‍රමේක්ෂ පහන (………)

● පහත සඳහන් වගුව අධ්‍යයනය කොට අංක **37** සිට **40** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| මුල්කෘතිය | රචකයා | අනුවර්තනය/පරිවර්තනය | අනුවර්තකයා/පරිවර්තකයා |
|---|---|---|---|
| **A** | සොෆොක්ලීස් | බෙරහඬ | බන්ධුල ජයවර්ධන |
| රන් ෆෝ යුවර් වයිෆ් | රේකුනී | රෝමය ගිනි ගනී | **B** |
| ද ග්ලාස් මිනාජරි | **C** | අහස් මාලිගා | හෙන්රි ජයසේන |
| ඖලාරියා | ප්ලවුටස් | **D** | මර්ලින් පීරිස් |

**37.** **'A'** අකුරට අදාළ මුල්කෘතිය වන්නේ,
(1) ඉක්නෙව්ටායි ය. (2) ප්‍රොටියස් ය. (3) කුක්ලොප්ස් ය.
(4) දික්ටුවොව්ල්කොයි ය. (5) ලයිකර්ගස් ය. (………)

**38.** **'B'** අකුරට අදාළ රචකයා වන්නේ,
(1) පරාක්‍රම නිරිඇල්ල ය. (2) ජයන්ත චන්ද්‍රසිරි ය. (3) ඊ.එම්.ඩී. උපාලි ය.
(4) හෙන්රි ජයසේන ය. (5) බන්දුල විතානගේ ය. (………)

**39.** **'C'** අකුරට අදාළ අනුවර්තනය/පරිවර්තනය වන්නේ,
(1) සැමුවෙල් බෙකට් ය. (2) ටෙනසී විලියම්ස් ය. (3) යූජින් ඕනිල් ය.
(4) ආතර් මිලර් ය. (5) බන්දුල විතානගේ ය. (………)

**40.** **'D'** අකුරට අදාළ අනුවර්තකයා/පරිවර්තකයා වන්නේ,
(1) පුරාජේරුකාර සෙබළා ය. (2) හොල්මන් ගෙදර ය. (3) නපුංසකයා ය.
(4) කහවණු මුට්ටිය ය. (5) කාසිනා ය. (………)

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

10386

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2017 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2017

නාට්‍ය හා රංග කලාව - සිංහල I
நாடகமும் அரங்கியலும் - சிங்களம் I
Drama and Theatre - Sinhala I

57 S I

## II කොටස

**උපදෙස්:**

✻ **A** හා **B** කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න.

## A කොටස

**1.** (i) නාට්‍යයක ගැටුම් අවස්ථාවක් නිර්මාණය කිරීමේ දී සැලකිල්ලට ගත යුතු කරුණු **හතරක්** දක්වන්න. (ලකුණු 04 යි.)

(ii) ඔබ ඉහත (i) හි දැක්වූ කරුණු අතුරින් **දෙකක්** නාට්‍ය පෙළකින් නිදසුන් දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු 05 යි.)

(iii) ඔබ ඉහත (ii) පිළිතුරෙහි නිදසුන් ලෙස ගත් නාට්‍ය කෘතියෙහි සාර්ථක-අසාර්ථකභාවය කෙරෙහි ගැටුම් අවස්ථාව බලපා ඇති අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

**2.** (i) නෘත්ත, නෘත්‍ය යනු කවරේ දැයි කෙටියෙන් ලියා දක්වන්න. (ලකුණු 04 යි.)

(ii) නාට්‍ය හැර සෙසු ප්‍රාසංගික කලා විෂයෙහි නෘත්ත හා නෘත්‍යයෙහි උපයෝගිතාව පහදන්න. (ලකුණු 05 යි.)

(iii) නෘත්ත හා නෘත්‍ය ඉක්මවා-යාමට නාට්‍යයට ඇති විශේෂ හැකියාව පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

**3.** (i) 'අනුකරණය' හා 'සමාරෝපය' යන පද පැහැදිලි කරන්න. (ලකුණු 04 යි.)

(ii) රූපණ කාර්යයේ ලා සමාරෝපය වැදගත් සේ සලකන රංග රීතියක් හඳුන්වා දෙන්න. (ලකුණු 05 යි.)

(iii) නාට්‍යධර්මී රංග ශෛලියට අනුව රූපණයේ යෙදීමේ දී සමාරෝපය අවශ්‍ය සාධකයක් වන්නේ දැයි සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි.)

## B කොටස

**4.** (i) සංස්කෘත නාට්‍යයේ වේදිකාව මත නිරූපණය **නොකළ** යුතු යැයි භරතමුනි විසින් සඳහන් කරනු ලැබ ඇති කරුණු **හතරක්** ලියන්න. (ලකුණු 04 යි.)

(ii) එසේ වේදිකාව මත නිරූපණය **නොකැරෙන** දැ ප්‍රේක්ෂකයාට දැනගැනීමට සලස්වනු ලබන නාට්‍ය ප්‍රයෝග **පහක්** ලියන්න. (ලකුණු 05 යි.)

(iii) ඉහත (ii) පිළිතුරෙහි ඔබ සඳහන් කළ නාට්‍ය ප්‍රයෝග **දෙකක්** පිළිබඳ නිදසුන් සහිත විස්තරයක් කරන්න. (ලකුණු 06 යි.)

**5.** (i) ජපානයේ 'නෝ' සහ 'කබුකි' වේදිකාවලට ආවේණික වූ, 'ප්‍රොසීනියම්' වේදිකාවේ දක්නට **නොලැබෙන** විශේෂ ලක්ෂණ **හතරක්** ලියන්න. (ලකුණු 04 යි.)

(ii) ඉහත (i) පිළිතුරෙහි ඔබ සඳහන් කළ ලක්ෂණ **දෙකක්** පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 05 යි.)

(iii) 'ප්‍රොසීනියම්' වේදිකාවට නොමැති, 'නෝ' සහ 'කබුකි' වේදිකා සතු ශක්‍යතා පිළිබඳ සමාලෝචනයක් කරන්න. (ලකුණු 06 යි.)

**6.** (i) ග්‍රීක ශෝකාත්ම හෙවත් ට්‍රැජඩි නාට්‍යයකින් ප්‍රේක්ෂකයා තුළ ජනනය කිරීමට අපේක්ෂා කැරෙන භාව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි.)

(ii) ඉහත (i) ට අදාළ ව ඔබ සඳහන් කළ භාව ජනනය වීම සඳහා කථා වස්තුව ගොඩනැගීමේ දී කවියකු අනුගමනය කළ යුතු ශිල්පීය කරුණු **හතරක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)

(iii) ඉහත (ii) පිළිතුරෙහි ඔබ සඳහන් කළ ශිල්පීය කරුණු අන්තර්ගත ග්‍රීක විචාර කෘතිය හා එහි කතුවරයා පිළිබඳ සමාලෝචනයක් කරන්න. (ලකුණු 06 යි.)

✻ ✻ ✻

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2017 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2017

නාට්‍ය හා රංග කලාව - සිංහල II
நாடகமும் அரங்கியலும் - சிங்களம் II
Drama and Theatre - Sinhala II

57 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

10387

විභාග අංකය : .................................

| I කොටස | |
|---|---|
| මුළු ලකුණු | 40 |

**උපදෙස්:**

* I කොටස – **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයා, II කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.
* II කොටස – A හා B කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

* එක් එක් ප්‍රශ්නයට අදාළ නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියෙන් ඇති **වරහන තුළ** ලියන්න.

**1.** නාඩගමේ ඉෂ්ට දේවතාරාධනාව හැඳින්වෙන වෙනත් නාම වන්නේ,
(1) කියා නටන සිංදුව, වචනේ සහ පූර්ණ විරිදුව ය. (2) පොතේ ඉන්නිසය, තර්ගය සහ විරිදුව ය.
(3) කියා නටන සිංදුව, මුලාරම්භය සහ පූර්ණ විරිදුව ය. (4) පොතේ කවිය, මුලාරම්භය සහ පූර්ණ විරිදුව ය.
(5) තර්ගය, මුලාරම්භය සහ පොතේ කවිය ය. (.........)

**2.** එදිරිවීර සරච්චන්ද්‍ර නාඩගමෙන් සිය රංග ශෛලියට උකහාගෙන ඇති අංග වන්නේ,
(1) සෙල්ලං ළමා, හඬ දූතයා, බහුබූතයා සහ පොතේ ඉන්නිසය ය.
(2) අනාගතවක්තෘ, අතීතවක්තෘ, පොතේගුරු සහ තර්ගය ය.
(3) ඉෂ්ට දේවතාරාධනය, පොතේගුරු, පොතේ ඉන්නිසය සහ තර්ගය ය.
(4) වචනේ, පූර්ණ විරිදුව, ඉෂ්ටදේවතාරාධනය සහ තර්ගය ය.
(5) සෙල්ලපිල්ලෙ, බෙරකාරයෝ, විරිදුව සහ බහුබූතයා ය. (.........)

**3.** උපත් කතාවට අනුව මුල්වරට කෝලම් වෙස් මුහුණු සාදන ලද්දේ මින් කවරකු විසින් ද?
(1) මහා සම්මත රජු (2) ශක්‍ර දේවේන්ද්‍රයා
(3) ඊශ්වර දෙවියා (4) මහා සම්මත රජ බිසව
(5) විශ්වකර්ම දිව්‍ය පුත්‍රයා (.........)

**4.** කිපී කප දෝසේ - වැදී පීනස් නාසේ
සිඳී ගොස් නාසේ - සැරව ලේ කුණු නිතර වෑසේ
ඉහත සඳහන් පද්‍යයෙන් හඳුන්වා දෙන කෝලම් චරිතය වන්නේ,
(1) ජෝඩි විදානේ ය. (2) අණබෙර කෝලම ය.
(3) හේවා කෝලම ය. (4) නොංචි කෝලම ය.
(5) ලෙන්චිනා කෝලම ය. (.........)

● පහත දැක්වෙන නූර්ති නාට්‍යවල නාම ආශ්‍රයෙන් අංක **5** සිට **7** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - රොලීනා D - ස්වර්ණතිලකා G - නාගානන්ද
B - ඔතෙලෝ E - සිංහබාහු H - පරාභව
C - සිරිසඟබෝ F - දස්කොන් I - විදුර

**5.** සී. දොන් බස්තියන්ගේ නාට්‍ය නිර්මාණ වන්නේ,
(1) A, D හා E ය. (2) A, C හා D ය. (3) C, E හා F ය. (4) C, D හා E ය. (5) D, E හා F ය.(.........)

**6.** චාල්ස් ඩයස්ගේ නිර්මාණ වන්නේ,
(1) B, C හා D ය. (2) B, G හා I ය. (3) B, F හා I ය. (4) C, G හා H ය. (5) G, H හා I ය.(.........)

**7.** ජෝන් ද සිල්වාගේ නිර්මාණ වන්නේ,
(1) A, C හා E ය. (2) C, D හා E ය. (3) D, E හා F ය. (4) C, F හා H ය. (5) B, F හා H ය.(.........)

[ දෙවැනි පිටුව බලන්න.

**8.** පාස්කු නාට්‍යයෙන් නිරූපණය වන අවස්ථා පිළිබඳව කියැවෙන පහත සඳහන් ප්‍රකාශ අතුරින් **නොගැළපෙන** පිළිතුර තෝරන්න.
(1) ජේසුස් වහන්සේ සිය ශ්‍රාවකයන් සමග අවසාන භෝජනය වැළඳීම
(2) ගෙත්සෙමෙනි උයනට ගොස් යාච්ඤා කිරීම
(3) ජූදාස් විසින් පාවාදෙනු ලැබීම
(4) සිර බන්ධනයට නියම වීම
(5) යුදෙව් පාලකයන් හා රෝමානු පාලකයන් ඉදිරියේ සමාව ලැබීම (.........)

● පහත සඳහන් තොරතුරු ඇසුරෙන් අංක **9** සිට **15** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - මෙලෙහි යකුන්
B - භික්ෂුව
C - මිළිඳු
D - යෙරුසලම
E - පාර්සි
F - දේවදූතයා
G - ඉරුගල් බණ්ඩාර
H - ඔඩ්ඩිස යාගය
I - සූරුවම
J - ඉන්ද්‍රසභා
K - මැණික්පාල ශාන්තිය
L - තල්පත්
M - ගර්දභ
N - නාගසේන

**9.** පාස්කු නාට්‍ය හා සම්බන්ධ වන්නේ,
(1) E හා F ය. (2) D හා I ය. (3) I හා J ය. (4) I හා L ය. (5) J හා L ය. (.........)

**10.** නූර්ති හා සම්බන්ධ වන්නේ,
(1) E හා J ය. (2) D හා J ය. (3) E හා I ය. (4) D හා I ය. (5) I හා F ය. (.........)

**11.** ආලවක දමනය හා සම්බන්ධ වන්නේ,
(1) B හා F ය. (2) C හා M ය. (3) B හා M ය. (4) F හා M ය. (5) L හා N ය. (.........)

**12.** සූවිසි විවරණය හා සම්බන්ධ වන්නේ,
(1) B හා F ය. (2) B හා L ය. (3) F හා N ය. (4) F හා L ය. (5) B හා M ය. (.........)

**13.** බෞද්ධ පූජාකර්මයක් හා සම්බන්ධ වන්නේ,
(1) B හා M ය. (2) E හා F ය. (3) C හා M ය. (4) F හා L ය. (5) C හා N ය. (.........)

**14.** උඩරට පළාතේ ප්‍රචලිත ශාන්තිකර්මයක් හා සම්බන්ධ වන්නේ,
(1) A හා G ය. (2) F හා M ය. (3) E හා L ය. (4) F හා N ය. (5) L හා N ය. (.........)

**15.** පහතරට සූනියම් යාගය හැඳින්වෙන වෙනත් නාම දෙකක් වන්නේ,
(1) A හා M ය. (2) H හා K ය. (3) F හා L ය. (4) E හා M ය. (5) B හා M ය. (.........)

**16.** ඊ.එෆ්.සී. ලුඩොවයික් ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කළ ප්‍රථම නාට්‍යය වන්නේ,
(1) ජ්ලවුටස්ගේ 'ද ට්වින්ස්' ය.
(2) කාලෝ ගොඩ්ගොනිගේ 'ද සර්වන්ට් ඔෆ් ටූ මාස්ටර්ස්' ය.
(3) ෂෙරිඩන්ගේ 'ද රයිවල්ස්' ය.
(4) ස්පාඤ්ඤ ජාතික ක්වින්ටරෝ සහෝදරයන්ගේ 'වෙයා විමෙන් රූල්' ය.
(5) මොලියෙර්ගේ 'ඉමැජිනරි ඉන්වැලිඩ්' ය. (.........)

**17.** ලංකා විශ්වවිද්‍යාලයීය සිංහල සමිතිය 1951 නිෂ්පාදනය කළ ඇන්ටන් චෙකොව්ගේ නාට්‍ය තුන වන්නේ,
(1) චෙරි උයන, මුහුදු ලිහිණියා සහ මුදලාලිගේ පෙරළිය ය.
(2) මඟුල් ප්‍රස්තාව, ඉබේ වෙදා සහ යමයාගේ තීන්දුව ය.
(3) හැංගිහොරා, මැනේජර් සහ යන්තම් බේරුණා ය.
(4) වැරදුණු දීගය, මඟුල් ප්‍රස්තාව සහ වළහා ය.
(5) මැනේජර්, මඟුල් ප්‍රස්තාව සහ වළහා ය. (.........)

**18.** පහත සඳහන් පිළිතුරු අතුරින් 'ටීටර්' හා 'මිනර්වා' නාට්‍යවලට සම්බන්ධ වූ නාට්‍යකරුවන් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) එදිරිවීර සරච්චන්ද්‍ර, ඊ.එෆ්.සී. ලුඩොවයික් (2) චාල්ස් ඩයස්, සී.දොන් බස්තියන්
(3) බී.ඒ.ඩබ්. ජයමාන්න, සිරිසේන විමලවීර (4) ඩබ්.බී. මකුලොළුව, ප්‍රේමසිරි කේමදාස
(5) නියුමාන් ජුබාල්, චිත්‍රසේන (.........)

**19.** ශ්‍රී ලංකාවේ දෙමළ නාට්‍ය කලාව සම්බන්ධ පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් **වැරදි** ප්‍රකාශය තෝරන්න.
(1) නූතන දෙමළ වේදිකාවට දේශපාලන නාට්‍ය හඳුන්වා දුන්නේ කණපතිපිල්ලේ ය.
(2) චෞර්ණලිංගම් විසින් 'ලංකා සුබෝධ විලාස සභා' නමින් දෙමළ නාට්‍ය කණ්ඩායමක් සංවිධානය කරන ලදී.
(3) නාට්ටුකුත්තුවලින් වෙනස් වූ ස්වාභාවික රංග ක්‍රම දෙමළ නාට්‍යකරුවන් විසින් අනුගමනය කරන ලදී.
(4) ලංකා විශ්වවිද්‍යාලය දෙමළ නාට්‍ය කලාව සම්බන්ධයෙන් දායකත්වයක් නො දැක්වී ය.
(5) එස්. විද්‍යානන්දන් දෙමළ නාට්‍ය කලාවට මෙන් ම පොදුවේ ශ්‍රී ලාංකේය නාට්‍ය කලාවට සිය දායකත්වය ලබා දුනි. (.........)

**20.** 'රාවණේසන්' නාට්‍යය සම්බන්ධ පහත සඳහන් ප්‍රකාශ අතුරින් **වැරදි** ප්‍රකාශය තෝරන්න.
(1) කාන්තා චරිත, පිරිමින් විසින් රඟපාන ලදී.
(2) රාමායණය පදනම් කොට ගත්ත ද සීතාගේ චරිතය ඇතුළත් නො වී ය.
(3) මුල් ම දෙමළ ස්වතන්ත්‍ර නාට්‍යයයි.
(4) 1964 දී එස්. විද්‍යානන්දන් මෙම නාට්‍ය රචනා කළේ ය.
(5) සාම්ප්‍රදායික වඩමෝඩි ශෛලියේ ආභාසය ලබා ඇත. (.........)

**21.** හින්දු බැතිමතුන් දීපාවලී උත්සවය සමරන්නේ කවර කරුණක් උදෙසා දැයි පහත දැක්වෙන පිළිතුරු අතුරින් තෝරන්න.
(1) දුර්ගා, ලක්ෂ්මී හා සරස්වතී අතර අරගලය පදනම්ව ය.
(2) නරකාසුරගේ මරණය සැමරීම පිණිස ය.
(3) විෂ්ණු හා බ්‍රහ්මා අතර වඩා උසස් පුද්ගලයා කවුරු දැයි ඇතිවූ වාදය සැමරීමට ය.
(4) සූර්ය වන්දනය පිණිස ය.
(5) සශ්‍රීකත්වය අපේක්ෂාවෙනි. (.........)

● පහත දැක්වෙන මාතෘකා ආශ්‍රයෙන් අංක **21** සිට **25** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | |
|---|---|---|
| A - සුබ සහ යස | F - ගුරුතරුව | K - පරපුටුවෝ |
| B - මධුර ජවනිකා | G - දෙවැනි මහින්ද | L - පළිගු රන |
| C - තලමල පිපිලා | H - ආනන්ද ජවනිකා | M - දෝන කතිරිනා |
| D - ගොඩෝ උන්නැහේ එනකං | I - රයිනෝසිරස් | N - අන්දරේලා |
| E - හිරු දහසක් | J - වෙළෙන්දාගේ මරණය | O - ගජමන් පුවත |

**22.** ඓතිහාසික මූලාශ්‍රය පදනම් කරගත් කෘති තුන වන්නේ,
(1) A, C හා E ය. (2) A, G හා M ය. (3) A, K හා N ය. (4) B, G හා O ය. (5) E, H හා M ය. (.........)

**23.** අසම්මත (ඇබ්සර්ඩ්) නාට්‍ය තුනක් වන්නේ,
(1) D, I හා K ය. (2) B, E හා I ය. (3) D, J හා K ය. (4) E, I හා K ය. (5) D, E හා I ය. (.........)

**24.** ඇමෙරිකානු අනුවර්තන නාට්‍ය තුන වන්නේ,
(1) D, E හා K ය. (2) E, J හා K ය. (3) E, J හා L ය. (4) D, I හා L ය. (5) I, J හා L ය. (.........)

**25.** චාරිතා රංගයට අයත් නාට්‍ය තුන වන්නේ,
(1) A, C හා N ය. (2) E, H හා O ය. (3) B, E හා K ය. (4) C, H හා N ය. (5) B, H හා O ය. (.........)

**26.** ජයලත් මනෝරත්නගේ නාට්‍ය වන්නේ,
(1) C, F හා G ය. (2) C, E හා N ය. (3) F, G හා M ය. (4) C, F හා N ය. (5) F, H හා N ය. (.........)

**27.** සුබ සහ යස නාට්‍යයේ දෙවැනි ජවනිකාව අවසානයට එන පහත සඳහන් ආත්මභාෂණය කවර චරිතයක් විසින් කරන ලද්දක් ද?
"ම්......... මගේ හිතට හරි නෑ. සිද්ධවෙගන යන දේවල්. දෙන්නා සහෝදරයෝ ......... සහෝදරයෝ විතරක් නොවෙයි. රාජ ලේ ගැව්ලාවත් නෑ."
(1) තුන්වැනි ඇමති (2) මහ ඇමති (3) දාසිය (4) සේවිකාව (5) සුමිත්ත (.........)

**28.** උදයන රජු ප්‍රකාශ කරන්නේ හස්තිකාන්ත මන්තරය කුමන ශාස්ත්‍රයට අයත් වූවක් බව ද?
(1) සතුන් හීලෑ කිරීමේ ශාස්ත්‍රයට (2) යුද ශාස්ත්‍රයට
(3) සංගීත ශාස්ත්‍රයට (4) වාස්තු ශාස්ත්‍රයට
(5) මෝහන ශාස්ත්‍රයට (.........)

**29.** ජූලියස් සීසර් නාට්‍යයේ තුන්වැනි අංකයේ තුන්වැනි දර්ශනයේ රෝම නාගරිකයන් විසින් ඝාතනය කරනු ලබන්නේ කවර තැනැත්තා ද?
(1) පබ්ලියස් (2) ෆ්ලේවියස් (3) මරුලස් (4) සින්නා (5) ආටිමිඩෝරස් (.........)

**30.** "සද්දේ නම් වැඩියි හා දැඟලිල්ලක් නම් තවත් නෑ මීනීවළක් වගේ නිශ්චලයි. අරකිට එන්න ඉඩ අරින්න ද? ඒක හොඳ ද? මං හිතන්නෙ ඒකි ආයිත් දඟලනවා කියල. නෑ දැන් ඉතින් මොකක්ද කරන්න තියෙන හොඳම වැඩේ? අරකි ඇතුළට ආවොත් සැකයක් නැතිව ම මගේ භාර්යාවට කතා කරනවා"
ඉහත සඳහන් ප්‍රකාශය අන්තර්ගත නාට්‍යය හා එය ඉදිරිපත් කරන චරිතය තෝරන්න.
(1) රූකඩ ගෙදර නාට්‍යයේ හෙල්මා (2) හැම්ලට් නාට්‍යයේ හැම්ලට් කුමාරයා
(3) ඇන්ටිගනී නාට්‍යයේ ක්‍රියෝන් (4) ඔතෙලෝ නාට්‍යයේ ඔතෙලෝ
(5) ජූලියස් සීසර් නාට්‍යයේ බ්‍රූටස් (.........)

**31.** ඔතෙලෝ පවසන්නේ ලේන්සුව තම මවට ලැබුණේ කවරකුගෙන් කියා ද?
(1) සිය පියාගෙන් (2) සයිප්‍රස් වැසියෙකුගෙන්
(3) ඊජිප්තු මායාකාරියකගෙන් (4) පරම්පරාවෙන්
(5) මිතුරියකගෙන් (.........)

[ හතරවැනි පිටුව බලන්න.

**32.** "ඇය ගොස් පුදසුන වෙතට, තියුණු පිහිය ද, ගෙනතින අඳුර වසන විට ඇය නෙත් මළගිය පුතුන් අමතා අවසන් හුස්ම සමගින - ශාප කළා ඇය ඝාතක ඔබට"
ඇන්ටිගනී නාට්‍යයේ එන ඉහත සඳහන් සංවාදය නික්මෙනුයේ කාගේ මුවින් ද?
(1) ගායන වෘන්දය (2) නායක ගායකයා (3) පණිවුඩකරු (4) මුරකරු (5) ටයිරීසියස් (.........)

**33.** අභිඥානශාකුන්තලයට පදනම් වූ "ශකුන්තලෝපාඛ්‍යානය" අන්තර්ගත වන්නේ කවර මූලාශ්‍රයේ ද?
(1) රාමායණය (2) භගවද්ගීතාව (3) ගීත ගෝවින්දය
(4) මහාභාරතය (5) ඍතුසංහාරය (.........)

**34.** රූකඩ ගෙදර නාට්‍යයේ අන්තර්ගත ග්‍රීක ට්‍රැජඩියේ ලක්ෂණ තුනක් සහිත පිළිතුර තෝරන්න.
(1) ප්‍රභූ පවුලක කථාවක් වීම, ට්‍රැජික් වීරයකු සිටීම සහ ප්‍රත්‍යභිඥානය සහිත වීම
(2) පශ්චාද්දෘෂ්ටිමය කථන ක්‍රමය, නාට්‍යයේ දිග හැරෙන සිද්ධි එක් දිනකට සීමා වීම සහ සංකේත භාවිතය
(3) චරිත සීමිත වීම, ප්‍රත්‍යාවර්තනය සහ ගායනවෘන්දය භාවිතය
(4) උපරිම අවස්ථාවකින් නාට්‍ය ඇරඹීම, කාව්‍යමය සංවාද යෙදීම සහ අංක සීමා වීම
(5) පශ්චාද්දෘෂ්ටිමය කථන ක්‍රමය, ක්‍රියාවේ ඒකාග්‍රතාව සහ චරිතවල පිරිමැසුම් භාවය (.........)

**35.** 'එළිසබෙතීන වේදිකාව' අයත් වන්නේ කුමන වේදිකා වර්ගයට ද?
(1) ප්‍රොසීනියම් (2) එළිමහන් (3) ප්‍රක්ෂිප්ත
(4) වෘත්තාකර (5) අර්ධ වෘත්තාකාර (.........)

**36.** ඔතෙලෝ, ජුලියස් සීසර් හා ඇන්ටිගනී නාට්‍යවලින් ප්‍රකට වන මුඛ්‍ය රසය කුමක් ද?
(1) භයානක රසය (2) වීර රසය (3) කරුණ රසය (4) අද්භූත රසය (5) හාස්‍ය රසය (.........)

**37.** පහත සඳහන් නාට්‍යකරුවන් අතුරින් ගායන වෘන්දයේ සහාය අවම වශයෙන් ලබාගත් නාට්‍ය රචකයා කවරෙක් ද?
(1) සොෆොක්ලීස් (2) යුරිපිඩීස් (3) ඊස්කිලස්
(4) ඇරිස්ටොෆානිස් (5) ෆ්‍රැනිකස් (.........)

**38.** පහත සඳහන් ප්‍රකාශ අතුරින් රස වින්දනය සම්බන්ධ **නොගැළපෙන** ප්‍රකාශය තෝරන්න.
(1) නාට්‍යය හොඳින් කියවීම හෝ නැරඹීම අවශ්‍ය ය.
(2) පොදුවේ නාට්‍ය කලාව පිළිබඳ පෘථුල අවබෝධයක් තිබිය යුතු ය.
(3) වාසනා ගුණය තිබිය යුතු ය.
(4) කලාකෘති පරිශීලනයෙන් අත් කර ගත් තියුණු මනසක් තිබීම ප්‍රයෝජනවත් ය.
(5) කෘතිය නරඹන හෝ කියවන අවස්ථාවෙන් පසුව වුව ද ලැබිය හැකි ය. (.........)

**39.** නාට්‍ය විචාරය සම්බන්ධ ලොව පැරණිතම කෘතිය ලෙස සැලකෙන්නේ,
(1) භරතමුනි විසින් රචිත නාට්‍යශාස්ත්‍රය ය.
(2) ඇරිස්ටෝටල්ගේ කාව්‍යශාස්ත්‍රය ය.
(3) හොරස්ගේ ආස් පොයටිකා ය.
(4) ලොන්ගිනස්ගේ සබ්ලයිම් ය.
(5) ධනංජයගේ දශරූපය ය. (.........)

**40.** නාට්‍ය විචාරය සම්බන්ධ පහත සඳහන් පිළිතුරු අතුරින් **නුසුදුසු** පිළිතුර තෝරන්න.
(1) නාට්‍යකලාවේ ගුණාත්මක වර්ධනයට දායක වේ.
(2) නාට්‍යකලාව පිළිබඳ ප්‍රේක්ෂක අවබෝධය පුළුල් වේ.
(3) රස වින්දන ශක්තිය වර්ධනයට දායක වේ.
(4) නාට්‍ය අනුවර්තනයක් ද, පරිවර්තනයක් ද ස්වතන්ත්‍ර ද යන්න නො සැලකේ.
(5) නාට්‍යයක සියලු අංශවල පවත්නා දුර්වලතා මතුකොට දැක්විය හැකි ය. (.........)

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

10387

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2017 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2017

නාට්‍ය හා රංග කලාව - සිංහල II
நாடகமும் அரங்கியலும் - சிங்களம் II
Drama and Theatre - Sinhala II

57 S II

## II කොටස

**උපදෙස්:**

✻ **A** හා **B** කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

### A - දේශීය නාට්‍ය කලාව

**1.** (i) ශ්‍රී ලංකාවේ ශාන්තිකර්මවල අන්තර්ගත නාට්‍යමය ලක්ෂණ **හතරක්** ලියන්න. (ලකුණු 04 යි.)

(ii) උඩරට හා පහතරට ප්‍රදේශවල ප්‍රචලිත ශාන්තිකර්ම දෙකකින් නිදසුන් සපයමින් ඔබ ඉහත (i) හි නම් කළ නාට්‍යමය ලක්ෂණ **දෙකක්** විමර්ශනය කරන්න. (ලකුණු 05 යි.)

(iii) නාට්‍යමය ලක්ෂණයෙන් අනූන ශාන්තිකර්මයක් තෝරාගෙන, එහි රඟමඩුලු සැරසිලි හා වේෂභූෂණ ගැන සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි.)

**2.** (i) 'සොකරි' නාට්‍යයේ අනුරූපණ අවස්ථා **හතරක්** නම් කරන්න. (ලකුණු 04 යි.)

(ii) සොකරි කථා ප්‍රවෘත්තිය නාට්‍යානුසාරයෙන් විකාසනය වීමේ දී ඔබ සඳහන් කළ අනුරූපණ අවස්ථා කථාව හා සම්බන්ධ ව නාට්‍යමය ගුණය මතු කරන අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)

(iii) සොකරි නාටකය පහතරට කෝලම් නාටකය හා සංසන්දනය කරන්න. ඔබේ සංසන්දනයට අවම වශයෙන් මූලික කරුණු **තුනක්වත්** අන්තර්ගත විය යුතු ය. (ලකුණු 06 යි.)

**3.** (i) 'සුබ සහ යස' නාට්‍යයේ මූලාශ්‍රය හා 'හස්තිකාන්ත මන්තරේ' නාට්‍යයේ මූලාශ්‍රය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 04 යි.)

(ii) සිය කෘති සඳහා ඉහත (i) හි සඳහන් නාට්‍යකරුවන් දෙදෙනා තෝරාගත් රංග ශෛලිවල උචිතානුචිත බව සාකච්ඡා කරන්න. (ලකුණු 05 යි.)

(iii) 'සුබ සහ යස' හා 'හස්තිකාන්ත මන්තරේ' යන නාට්‍ය දෙක අතුරින් වඩා පුළුල් ජීවන දෘෂ්ටියක් සහිත නාට්‍ය කෘතිය ලෙස ඔබ සලකන්නේ කුමක් ද? හේතු දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි.)

### B - විදේශීය නාට්‍ය කලාව

**4.** (i) අභිඥානශාකුන්තලයේ ආධිකාරික ඉතිවෘත්තය හා ප්‍රාසංගික ඉතිවෘත්තය පැහැදිලි කරන්න. (ලකුණු 04 යි.)

(ii) අභිඥානශාකුන්තල නාට්‍යයේ ප්‍රාසංගික ඉතිවෘත්තයෙන් නිරූපණය වන චරිත **දෙකක්** පිළිබඳ විමර්ශනය කරන්න. (ලකුණු 05 යි.)

(iii) ප්‍රාසංගික වස්තුව ආධිකාරික වස්තුවේ නාට්‍යමය ගුණය තීව්‍ර කිරීමට කෙසේ දායක වී ඇති දැයි සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි.)

**5.** (i) රූකඩ ගෙදර නාට්‍යය ආරම්භ වන විට ප්‍රේක්ෂකයාට දර්ශනය වන ගෘහාභ්‍යන්තරය නිරූපිත පසුතලයේ ස්ථානගත කොට ඇති ගෘහෝපකරණ **හතරක්** නම් කරන්න. (ලකුණු 04 යි.)

(ii) ප්‍රේක්ෂකයා ඉදිරියේ තිරය විවෘත වන විට මැවෙන දර්ශනය හා රූකඩ ගෙදර නාට්‍යයේ යථාර්ථය අතර සම්බන්ධය ඔබ වටහා ගන්නේ කෙසේ දැයි දක්වන්න. (ලකුණු 05 යි.)

(iii) රූකඩ ගෙදර නාට්‍යයේ 'නත්තල් ගස' සහ 'තරන්තලා ඇඳුම', නෝරා සහ හෙල්මගේ කුටුම්බය ධ්වනිතාර්ථවත් කරන්නේ කෙසේ දැයි සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි.)

**6.** (i) ඇන්ටිගනී සහ ජූලියස් සීසර් නාට්‍ය දෙකෙහි දෘශ්‍යමාන සමාන ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි.)

(ii) ඇන්ටිගනී සහ ජූලියස් සීසර් නාට්‍ය දෙකෙහි ඛේදනීය වීරයන්ගේ අරමුණුවල ශ්‍රේෂ්ඨත්වය හෝ අධමත්වය ඔබ දකින්නේ කෙලෙසින් දැයි පෙන්වා දෙන්න. (ලකුණු 05 යි.)

(iii) ඇන්ටිගනී සහ ජූලියස් සීසර් නාට්‍ය දෙකින් වඩාත් සංවේදී නාට්‍යය ලෙස ඔබ සලකන්නේ කුමක් දැයි සහේතුක ව දක්වන්න. (ලකුණු 06 යි.)

✻ ✻ ✻